# මුදල් අමාත්‍යාංශය
# நிதி அமைச்சு
# MINISTRY OF FINANCE

මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව.
செயலகம், கொழும்பு 01. இலங்கை
The Secretariat, Colombo 01. Sri Lanka

කාර්යාලය / அலுவலகம் / Office: (94)-11-2484500, (94)-11-2484600, (94)-11-2484700
ෆැක්ස් / பெக்ஸ் / Fax: (94)-11-2449823
වෙබ් අඩවිය / வெப் சைட் / Website: www.treasury.gov.lk


මගේ අංකය / எனது இல. / My No.: BD/RDS/106/07/04

ඔබේ අංකය / உமது இல. / Your No.:

දිනය / திகதி / Date: 2016.12.30

**ජාතික අයවැය චක්‍රලේඛ අංකය: 04/2016**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් / දිසාපතිවරුන්
සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත.

**හදිසි ආපදා තත්ත්වයකදී ධීවර කටයුතු වල නියැලී සිටියදී මියයන ධීවරයන් සඳහා වන්දි ලබා දීමට අදාළ උපදෙස්**

හදිසි ආපදා තත්ත්වයකදී ආපදා අවදානම අවම කිරීම සඳහා ධීවර ජනතාව ආවරණය වන පරිදි රක්ෂණාවරණයක් ලබා දීමට රජය විසින් දැනටමත් කටයුතු කර ඇති අතර ඒ යටතේ ජාතික රක්ෂණ භාර අරමුදල විසින් ආපදාවට පත් වූ ධීවරයින් සඳහා වන්දි ලබා දීමට කටයුතු කරනු ඇත.

**02.** ඒ අනුව, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි වී සිටින ධීවරයෙකු ධීවර වෘත්තියෙහි නියැලී සිටිය දී මුහුදේ දී වන අනතුරකදී සිදුවන ජීවිත හානියක් වෙනුවෙන් රු.මිලියන 1ක් දක්වා වන්දි මුදලක් ලබා ගැනීමට හානියට පත් වූ පාර්ශවයට හැකියාව ලැබේ. එසේම, ධීවර කටයුතුවල නියැලී සිටියදී අතුරුදහන්වන ධීවරයන් සෙවීම, ගලවා ගැනීමේ මෙහෙයුම් සඳහා යන වියදම් ද ආවරණය කරනු ලබයි.

**03. වන්දි ගෙවීම සඳහා අනුගමනය කළයුතු ක්‍රමවේදය:**

**(i) ජීවිත හානි සඳහා වන්දි ලබා දීම**

වන්දි ලබා ගැනීම සඳහා අනතුරට ලක් වූ ධීවරයා අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය භාර ධීවර සහකාර අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය සහිතව එම තොරතුරු ප්‍රාදේශීය ලේකම් විසින් ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමු කල යුතුය. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් අදාල අතුරුදහන් වීම හෝ මියයාම තහවුරු කර ගැනීමෙන් පසු ඒ බව ජාතික රක්ෂණ භාර අරමුදල වෙත දැන්වීමෙන් පසු වන්දි ලබා දීමට කටයුතු කරනු ඇත.

**(ii) වියළි ආහාර ලබා දීම**

හදිසි ආපදා තත්ත්වයන් හේතුවෙන් මුහුදේ දී අතුරුදහන්වන හා මිය යන ධීවරයින්ගේ පවුල් වල යැපෙන්නන්හට මාස 03ක කාලයක් දක්වා පමණක් වියළි සලාක ලබා දිය හැකිය. ඒ සඳහා අදාළ ප්‍රාදේශීය ලේකම් විසින් එසේ අතුරුදහන් වූ ධීවරයන් පිළිබඳ විස්තර ධීවර සහකාර අධ්‍යක්ෂවරයාගේ නිර්දේශය සමඟ දිස්ත්‍රික් ලේකම් වෙත ඉදිරිපත් කල යුතුය.

දිස්ත්‍රික් ලේකම්ගේ අනුමැතිය පරිදි ප්‍රාදේශීය ලේකම් විසින් වියළි සලාක ලබා දීමට කටයුතු කල යුතුය. කෙසේ වුවද, මාස තුනක කාලය අතරතුර ධීවරයින් නැවත පැමිණීම හෝ පවුලේ යැපෙන්නන් සඳහා අදායම් මාර්ගයක් සැලසී තිබීම යන කරුණු සලකා වියළි ආහාර ලබාදීම නතර කළ යුතුය.

**වියළි සලාක වෙනුවෙන් සතියකට උපරිම වැය කල හැකි මුදල**

| | රුපියල් |
|---|---|
| තනි පුද්ගලයෙකු සඳහා | 700 |
| සාමාජිකයින් 02 යුත් පවුලකට | 900 |
| සාමාජිකයින් 03 යුත් පවුලකට | 1,100 |
| සාමාජිකයින් 04 යුත් පවුලකට | 1,300 |
| සාමාජිකයින් 05 යුත් පවුලකට | 1,500 |

වියළි සලාක ලබා දීම සඳහා විවිධ සේවා සමුපකාර සහ සතොස අලෙවිසැල් වලින් සෘජුව ද, එයට අමතරව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ යටතේ මිල ගණන් කැඳවා බාහිර සැපයුම්කරුවන්ගෙන්ද මිලදී ගැනීම සිදු කල හැකිය.

**04.** මුදල් අමාත්‍යාංශය මගින් මීට පෙර නිකුත් කර ඇති ජාතික අයවැය චක්‍රලේඛ අංක 152 (I), 152(II) හා 152 (III) චක්‍රලේඛ මේ සමඟ අවලංගු කර ජාතික අයවැය චක්‍රලේඛ අංක 04/2016 නිකුත් කරනු ලැබේ. ඒ අනුව, මෙම චක්‍රලේඛය 2017.01.01 දින සිට බලපැවැත්වෙනු ඇත.

**05.** මෙම චක්‍රලේඛය පිළිබඳව යම්කිසි පැහැදිලි කිරීමක් අවශ්‍ය වේ නම් ජාතික අයවැය දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් (දුරකතන අංක 011 – 2484665) විමසිය යුතුය.

**ආර්.එච්.එස්.සමරතුංග**
**භාණ්ඩාගාරයේ ලේකම්**

පිටපත්:

1. ජනාධිපති ලේකම්
2. අග්‍රාමාත්‍ය ලේකම්
3. අමාත්‍ය මණ්ඩලයේ ලේකම්
4. ස්වදේශ කටයුතු අමාත්‍යාංශ ලේකම්
5. ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශ ලේකම්
6. ආපදා කළමනාකරණ අමාත්‍යාංශ ලේකම්
7. සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශ ලේකම්
8. පළාත්සභා හා පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්

(4 – 8: අදාළ වන පරිදි නිලධාරීන් වෙත උපදෙස් නිකුත් කිරීම සඳහා)

9. ජාතික රක්ෂණභාර අරමුදලේ සභාපති
10. විගණකාධිපති